**වෝටර්ස් ඒජ් සමාගම - 2017**

**-------------------------------------**

වෝටර්ස් ඒජ් සමාගමේ ("සමාගම") 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කල යුතුයැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්‍ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්‍ෂ මණ්ඩලයේ වගකීම වේ.

**1.3** **විගණකගේ වගකීම**

-------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්‍ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්‍ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්‍ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1** **මතය**

**------**

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට වෝටර්ස් එජ් සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තියෙන් දක්වා ඇති පරිදි, මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) විගණන මතය සඳහා පදනම සහ විගණනයේ විෂය පථය හා සීමා කිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) විගණනය සඳහා අවශ්‍ය සියලුම තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගත් බවත්, මාගේ විගණන පරීක්ෂණ වලින් පෙනීයන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,
සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ දැක්වෙන අවශ්‍යතාවයන් හා අනුකූලවන බවත් මා දරන්නා වූ මතය වේ.

**2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**2.2.1 සම්බන්ධිත පාර්ශව ගනුදෙනු**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකරණ තීන්දුවක් මත නාගරික සංවර්ධන අධිකාරිය වෙත හිමිකාරිත්වය පැවරී ඇති සමාගමේ රු.මිලියන 642.5 ක වටිනාකමින් යුතු ඉඩම් හා ගොඩනැගිලි හා එහි අලුත්වැඩියා කටයුතු සඳහා ලබාදී තිබූ රු.මිලියන 200 ක් වෙනුවෙන් එම අධිකාරිය වෙත කොටස් නිකුත් කිරීම සඳහා සමාගම විසින් ඉල්ලීමක් කර තිබූ නමුත්, 2017 දෙසැම්බර් 31 දින දක්වාම කොටස් නිකුත් කිරීමක් සිදුකර නොතිබුණි. තවද රු.මිලියන 842.5 ක අගයකට කොටස් නිකුත් කිරීමේ එකඟතාවයක් (Pending Allotment of shares) පවතින බව සමාගමේ ශේෂ පත්‍රයේ දක්වා තිබුණද නාගරික සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන වලට අනුව එම අගය රු. මිලියන 436 ක් විය. එසේම කොටස් නිකුත් කිරීම සඳහා වූ විධිමත් ගිවිසුමක් සමාගම හා නාගරික සංවර්ධන අධිකාරිය අතර ඇතිකරගෙන නොතිබුණි.

(ආ) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල සම්බන්ධිත පාර්ශව ගනුදෙනු යටතේ නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු ලෙස රු.මිලියන 224.13 ක් දක්වා තිබුණද, එම අධිකාරියේ ගිණුම්වලට අනුව සමාගමෙන් ලැබිය යුතු ලෙස රු.මිලියන 190ක් දක්වා තිබීම හේතුවෙන් මෙම ශේෂය රු. මිලියන 414.13 කින් වෙනස් වී තිබුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනට වෙළඳ හා අනෙකුත් ලැබීම් ශේෂය රු.384,709,140 ක් වූ අතර ඉන් වෙළඳ ණයගැති ශේෂය රු.118,003,866 ක් විය. ආයතනය විසින් අනුගමනය කරනු ලබන ණය ප්‍රතිපත්තියට අනුව ජංගම වෙළඳ ණයගැතියෝ දින 30 ක් ඇතුලත නිරවුල් කල යුතු වුවද මෙම සියලුම වෙළඳ ණයගැතියන් දින 30 ඉක්මවා තිබුණි. එසේම දින 365 ඉක්මවූ වෙළඳ ණයගැති ශේෂය රු.9,146,062 ක් වූ අතර රාජ්‍ය අංශයේ ආයතන වලින් සමාගමට රු. 35,907,510 ක මුදලක් ලැබිය යුතුව පැවතුණි.

(ආ) සමාගම විසින් ණයහිමියන් සඳහා ගෙවීම් කිරීම සඳහා විධිමත් ණයහිමි ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 158 ක වෙළඳ ණයහිමි ශේෂයක් පැවති අතර ඉන් දින 120 ට වඩා වැඩි ණය හිමි ශේෂය රු. මිලියන 15 ක් විය.

(ඇ) සමාගමේ සේවය හැරගොස් තිබූ සේවකයන් වෙනුවෙන් සමාගම මගින් ගෙවා තිබූ රු.791,041 ක් වූ රක්ෂණ වාරික අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.4 නිති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

**--------------------------------------------------------------------------------**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති රීති රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756 හා 2016 මාර්තු 31 දිනැති 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රෙගුලාසි ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) 5.2.4 වගන්තිය | වාර්ෂික අයවැය අදාල වර්ෂය එළඹීමට මාස 03 කට පෙර අනුමත කල යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය අනුමත කර තිබුණේ සමාලෝචිත වර්ෂයේ ජනවාරි 20 දින දීය. |
| (ii) 7.3 වගන්තිය | රාජ්‍ය ව්‍යාපාර, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් ඒ ආකාරයට පිළිපැදිය යුතු වන අතර අනෙකුත් ක්‍රියා පරිපාටි හා විධිවිධාන ආයතනයේ අවශ්‍යතාවලට අනුරූපීව සකස්කරයි නම් ඒ වෙනුවෙන් රේඛීය අමාත්‍යාංශයේ හා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. එහෙත් සමාගම විසින් පිළියෙල කරන ලද ක්‍රියා පරිපාටි හා විධිවිධාන සම්බන්ධයෙන් එලෙස අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (iii) 9.2 (ඩී) වගන්තිය | සමාගම සඳහා සංවිධාන සටහනක් පිළියෙල කිරීමට සහ අනුමත කාර්ය මණ්ඩලය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**--------------------**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

**-------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු. 184,074,248 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු. 241,716,882 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.57,642,634 කින් පිරිහී තිබුණි. සමාලෝචිත වර්ෂය තුල මෙහෙයුම් ආදායම රු.128,162,393 කින් වර්ධනය වී තිබූ නමුත් පරිපාලන වියදම රු.139,040,056 කින් සහ බෙදාහැරීමේ

වියදම් රු. 28,899,540 කින් ඉහල යාම මෙන්ම සමාගමේ මූල්‍ය ආදායම රු.12,039,378 කින් අඩුවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේදී රු. මිලියන 114 ක් වූ සමාගමේ ශුද්ධ ලාභය 2016 වර්ෂය වන විට රු. මිලියන 242 ක් දක්වා අඛණ්ඩව වැඩි වී තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 184 ක් දක්වා අඩු වී තිබුණි .කෙසේ වුවද ,මූල්‍ය ප්‍රතිඵලයට ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය, සේවක පාරිශ්‍රමික හා රජයට ගෙවූ බදු නැවත ගැලපීමේදී 2013 වර්ෂයේ දී රු. මිලියන 259 ක් වූ සමාගමේ දායකත්වය 2016 වර්ෂය වනවිට රු. මිලියන 654 ක් දක්වා අඛණ්ඩව වැඩි වී තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 585 ක් දක්වා අඩු වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා වූ සමාගමේ ඇතැම් වැදගත් ගිණුම්කරණ අනුපාත ඉකුත් වර්ෂය සමග සසඳා පහත දැක්වේ.

| | **2017** | **2016** |
|---|---|---|
| දල ලාභ ආන්තිකය (සියයට) | 62.58 | 62.87 |
| ශුද්ධ ලාභ ආන්තිකය (සියයට) | 13.94 | 20.28 |
| ජංගම අනුපාතය (වාර ගණන) | 1.62:1 | 1.62:1 |

ඉහත තොරතුරුවලට අනුව සමාගමේ දල ලාභ අනුපාතයේ සැළකිය යුතු වෙනස්වීමක් සිදුවී නොතිබුණ ද ශුද්ධ ලාභ අනුපාතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 6.34 කින් පහල ගොස් තිබුණි. මේ සඳහා ප්‍රධාන වශයෙන් බෙදාහැරීම් වියදම් ලෙස ගැනෙන ප්‍රචාරණය, උත්සව සංවිධානය කිරීමේ වියදම්, සංගීත වැඩසටහන් ඉදිරිපත් කිරීමේ වියදම් පිළිවෙලින් සියයට 105, සියයට 170 සහ සියයට 42.63 බැගින් වැඩි වි තිබීම සහ මුළු මානව සම්පත් වියදම සියයට 24.38 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. එසේම සමාගමේ ජංගම අනුපාතය ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී නොවෙනස්ව පැවතියද සමාලෝචිත වර්ෂයේදී ජංගම වත්කම් රු. මිලියන 83 කින්ද ජංගම බැරකම් රු.මිලියන 52 කින්ද වර්ධනය වී තිබුණි. කෙසේවුවද, සමාගම, ජංගම අනුපාතය ප්‍රශස්ථ මට්ටමකින් පවත්වාගෙන යාමට සමාගම අපොහොසත් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

(අ) 2004 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 01/2004 ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සමාගම විසින් පිළියෙල කර නොතිබුණි.

(ආ) සමාගම විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කිරීම සඳහා පෞද්ගලික පාර්ශවයක් සමග ගිවිසුම්ගත වී ඒ සඳහා රු.2,163,021 ක් වැයකර තිබූ අතර ගිවිසුම් ගත කොන්දේසි අනුව, මාස 02 ක් ඇතුලත සංයුක්ත සැලැස්ම සකස් කළ යුතු විය. එහෙත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය වන විට ද එම සැලැස්ම පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

## 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

-----------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා සමාගම විසින් ගනුදෙනුකරුවන්ගේ දෘෂ්ඨි කෝණය, මූල්‍ය දෘෂ්ඨි කෝණය, ක්‍රියාවලි දෘෂ්ඨි කෝණය සහ ජනතාවගේ දෘෂ්ඨි කෝණය මත පදනම්ව දෙපාර්තමේන්තු 15 ක් වෙනුවෙන් ප්‍රධාන කාර්යසාධන දර්ශක (ප්‍ර.කා.ද) පිළියෙල කර තිබුණි. මෙම කාර්ය සාධන දර්ශක අනුව සියලු දෙපාර්තමේන්තු විසින් සමාලෝචිත වර්ෂයේදී සියයට 70 කට වඩා වැඩි කාර්යසාධනයක් ලභාකරගෙන තිබූ අතර තවදුරටත් පහත සඳහන් නිරීක්‍ෂණ සිදුකරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ඉලක්කගත මුළු ආදායමට වඩා තථ්‍ය ආදායම රු.මිලියන 101 කින් අඩු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ඉලක්කගත සේවක පිරිවැටුම සියයට 10 ක් වුවද එය සියයට 22.42 ක් දක්වා වැඩි වී තිබූ අතර බැන්කට් මෙහෙයුම් සහ මුළුතැන්ගෙයි (Kitchen) යන අංශයන්හි වැඩිම සේවක පිරිවැටුමක් වාර්තා වී තිබුණි.

(ඇ) සේවක නොපැමිණීම්වල ඉලක්කගත මට්ටම සියයට 8 ක් වුවද සමාලෝචිත වර්ෂයේදී එය සියයට 16.62 ක් දක්වා වර්ධනය වී තිබූ අතර සේවකයින් ගණන 66 ක් විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්‍ෂණ කරනු ලැබේ.

(අ) සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩලය සහ භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් අනුමත කරන ලද විධිමත් ණය ප්‍රතිපත්තියක් (Credit Policy) නොතිබීම හේතුවෙන් ණය පදනම මත සේවා සැපයීමේදී එකිනෙකට වෙනස් ණය ප්‍රතිපත්ති අනුගමනය කර තිබුණි. එසේම ණය කාලසීමාව ඉක්මවූ හිඟ ණයගැති ශේෂ සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන නොතිබුණි. තවද, නාමමාත්‍රිකව පවතින ණය ප්‍රතිපත්තිය (Credit Policy) අනුව ණය පදනම මත සේවා සැපයීම අනුමතකර ඇති ආයතන ගණන 150 ක් වුවද සමාගමේ ණයගැති ලේඛනයේ ඇතුලත් ණය ගැති ශේෂ 165 ක් පැවති අතර ඒ අතුරින් ආයතන 144 ක් සමාගම විසින් ණය පදනම මත සේවා සැපයීම අනුමත කර නොමැති ආයතන බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා මිල කිරීමේ ප්‍රතිපත්තියක් අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් අනුමත කර නොතිබුණු අතර පිරිවැය ඇස්තමේන්තු නොමැතිව සහ ඉතා අඩු මිල ගණන් යටතේ රාජ්‍ය ආයතන සඳහා සපයන සේවාවන් වල විකුණුම් මිල තීරණය කර තිබුණි. මෙය ආයතනයේ කීර්තිනාමයට මෙන්ම ගුණත්වයටද ගැටලුකාරී තත්ත්වයක් ඇතිවිය හැකි බව නිරීක්‍ෂණය විය.

(ඇ) ආහාර විසවීමක් නිසා වූ වන්දි වශයෙන් අධ්‍යක්‍ෂ මණ්ඩල තීරණයක් අනුව, රු.1,000,000 ක් සමාලෝචිත වර්ෂයේදි පාරිභෝගිකයෙකුට ගෙවා තිබූ අතර ඉන් අනතුරුවද එකී තත්ත්වය සම්බන්ධයෙන් කිසිදු ආරක්‍ෂක පියවරක් අනුගමනය කිරීමට සමාගම අපොහොසත් වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.642,500,000 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි නාගරික සංවර්ධන අධිකාරියට අයත්ව පැවති අතර නාගරික සංවර්ධන අධිකාරියේ 2014 ජුනි 11 දිනැති ලිපිය ප්‍රකාරව එම වත්කම් සමාගම විසින් ප්‍රාග්ධනිත කර තිබුණි. කෙසේ වුවද මේ සම්බන්ධව විධිමත් පරිදි පාර්ශව දෙක අතර කල්බදු ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා නාවික හමුදාව සමඟ ඒකාබද්ධව පාවෙන අවන්හල් ක්‍රියාත්මක කිරීම තුලින් සමාලෝචිත වර්ෂය තුල සමාගම රු.2,975,646 ක ආදායමක් උත්පාදනය කර තිබුණද ඒ සම්බන්ධයෙන් නාවික හමුදාව සමග විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

**4.3 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9 ඡේදය ප්‍රකාරව, සමාගම සඳහා කාර්ය මණ්ඩල බඳවාගැනීම හා උසස් කිරීම් පටිපාටියක් පිළියෙල කර නොතිබුණි.

**4.4 කොන්ත්‍රාත් පරිපාලනය**

--------------------------

සමාගම විසින් සකස් කර තිබූ බලතල පැවරීමේ ප්‍රකාශනය ප්‍රකාරව රු.මිලියන 200 ට වැඩි කොන්ත්‍රාත් සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවක අනුමැතිය ලබාගත යුතුය. මෙම අවශ්‍යතාවයෙන් බැහැරවීමේ අරමුණින් සමාගමේ මුළු කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 269 ක් වූ Back of House (BOH) ව්‍යාපෘතිය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.4 මාර්ගෝපදේශයට පටහැනි ලෙස අනු ව්‍යාපෘති 11 කට වෙන්කර කොන්ත්‍රාත්කරුවන් 11 දෙනෙකුට හා මුළු වියදම රු. මිලියන 37.7 ක් වූ Sports Bar ව්‍යාපෘතිය කොටස් 09 කට වෙන්කර, කොන්ත්‍රාත්කරුවන් 09 දෙනෙකුට ප්‍රදානය කර තිබුණි. එසේ ප්‍රධාන ඉදිකිරීමක එක් එක් කොටස් එකිනෙකට වෙනස් කොන්ත්‍රාත්කරුවන් විසින් සිදුකිරීමට යාමේදී, කොන්ත්‍රාත් වැඩ ආරම්භ කිරීම ප්‍රමාදවීම හේතුකොටගෙන සමස්ත ඉදිකිරීම ප්‍රමාදවීම සහ එක් එක් කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීමේ අඩුපාඩු ප්‍රධාන ඉදිකිරීමට බලපෑම වැනි ගැටළු ඇතිවී තිබූ අතර ඒ හේතුවෙන් නියමිත කාලය තුළ ඉදිකිරීම් සම්පූර්ණ කිරිමට නොහැකි වී තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

----------------------------------------

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

-----------------------------------------

2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී/12 හි 6.5.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත විගණනයට ඉදිරිපත් කල යුතු වුවද, 2017 වර්ෂයට අදාළ සමාගමේ මූල්‍ය ප්‍රකාශන මාස 07 ක ප්‍රමාදයකින් පසුව ඉදිරිපත් කර තිබුණේ 2018 සැප්තැම්බර් 28 දිනදීය.

**5.2 වාර්ෂික අයවැය ලේඛනය**

-------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත සහ සත්‍ය ආදායම් සහ වියදම් අතර සියයට 20 සිට සියයට 968 දක්වා වූ පරාසයක් තුළ විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

**5.3 විගණන හා කළමනාකරණ කමිටු**

---------------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ ඡේද අංක 7.4.1 ප්‍රකාරව, අවම වශයෙන් මාස 03 කට වරක් විගණන කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත් සමාගම විසින් 2017 ජූලි මාසයෙන් පසුව විගණන කමිටු පවත්වා නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදි නිරීක්‍ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍රය | | නිරීක්‍ෂණ |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | (i) | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. |
| | | (ii) | කර්මාන්තයේ නියමයන් වන වසර 40 ත් වසර 50 ත් නොසලකා සමාගම විසින් හෝටල් ගොඩනැගිලි වසර 80 ක් මුළුල්ලේ ක්‍ෂයකර තිබීම. |
| (ආ) | ණයගැති පාලනය | (i) | ණයගැති ශේෂ සැසඳීම් ප්‍රකාශන පිළියෙල නොකිරීම හා යාවත්කාලීන නොකිරීම. |
| (ඇ) | තොග පාලනය | (i) | යල්පැනගිය හා සෙමෙන් චලනය වන තොග හඳුනා ගැනීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබීම. |
| | | (ii) | තොග සත්‍යාපනයේදී හඳුනාගත් වෙනස්කම් සඳහා සැසඳීම් සිදුකර නොතිබීම. |
| | | (iii) | ඉන්වෙන්ට්‍රි තක්සේරු කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අඛණ්ඩව භාවිතාකර නොතිබිම. |
| (ඈ) | ගිණුම්කරණය | (i) | ජ'නල් සටහන් ඇතුලත් කිරීමේදී අනුක්‍රමික අංක පිළිවෙලක් අනුගමනයකර නොතිබීම. |
| | | (ii) | ජ'නල් සටහන් ඇතුලත් කිරීම සහ අනුමත කිරීම සඳහා කාර්ය මණ්ඩලය අතර වැඩ බෙදීමක් සිදුකර නොතිබීම. |
| | | (iii) | ඉන්වෙන්ට්‍රිවල අඩුපාඩු නිවැරදි කිරීමට යොදාගන්නා බැරපත් සඳහා අනුමැතිය ලබාදීමේ ක්‍රමවේදයක් පැවතීම. |
| | | (iv) | සමාගම භාවිතාකරන සන්නිවේදන උපකරණවල ඵලදායී ජීවිත කාලය වෙනස් කිරීම සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබීම . |
| (ඉ) | පරිගණක පද්ධති පාලනය | | ප්‍රමිත ක්‍රමවේදයකට අනුකූල නොවීම නිසා පරිගණක මෙහෙයුම් පද්ධති මත භෞතික පාලනය පහල මට්ටමක පැවතීම. |